Law & Society Trust

ESCR | Newsletter

ISSUE 12, DECEMBER 2014



# අදිසි මිනිසා පිළිබඳ වෘත්තාන්තය: පුරුෂ සංක්‍රමණික සේවකයන්ගේ අයිතීන් සුරකීම




**Photo : ILO Apex Image**

"මගේ තාත්තා අපිට හැමදාම කතා කරලා එයාව නැවත ගෙන්න ගන්න කියලා කිවුවා. ඔහු වැඩ කරන තැන පුද්ගලයා ඔහුට නිතරම ගහනවා. ඔහුගේ වීසා ඉවර වෙලා තිබුණත් ඔහුට ආපසු එන්න දුන්නේ නැහැ. තාත්තා මේ පසුගිය මාර්තු 8 වෙනිදා මිය ගියා. ඊට පස්සේ ඔහුගේ මිනිය ලංකාවට ගෙනාවා. තාත්තාගේ වැටුප් මාස 18 කින් ගෙවලා නැහැ. ඒ වගේම ලංකාවේ විදේශ සේවා නියුක්ති කාර්යාංශය ඒ පිළිබඳව කිසිම ක්‍රියාමාර්ගයක් අරගෙනත් නැහැ."- කෑගල්ලේ සරත් වසන්ත කුමාරගේ පුතා. සරත් 2011 දී සෞදි අරාබියට ගොස් තිබුණේ අශ්වාරෝහකයෙකු ලෙසටයි.[1]

සරත් මෙන්ම වඩා හොඳ රැකියා අවස්ථා සොයා විදේශගත වන තවත් බොහෝ පුද්ගලයින්, ඔවුන් බලාපොරොත්තු වූ අවස්ථා එහි නැති බව තේරුම් ගන්නේ ඉතා කටුක අත්දැකීම් වලට මුහුණපෑමට සිදුවීමෙන් පසුවය. ශ්‍රී ලංකාවේ විදේශ සේවකයන් පිළිබඳ සංවාදයේදී නිරන්තරයෙන්ම මැදපෙරදිග ගෘහ සේවිකාවන් ලෙස රැකියා කරන කාන්තාවන් කෙරේ පමණක් අවධානය යොමුවී ඇත. එනිසා එම ගැටළුව කාන්තාවන්ට පමණක් බලපාන කරුණක් බවට පත් වී ඇත.

මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, රැකියා සඳහා විදේශගත වන පුරුෂයින් සම්බන්ධ ගැටළු වලට අවධානය යොමු නොවේ. එසේත් නැත්නම් කාන්තාවන් කෙරේ පමණක් අවධානය යොමු වූ කථිකාවන් තුළින්ම අතුරුදහන් වී යාමයි. මෙය 2011 දී පුරුෂයින් 51% ක් රැකියා සඳහා විදේශගත වීම පවා නොසලකා හරිනු ලබයි. එලෙස විදේශ රැකියා සඳහා පුරුෂයින් ප්‍රමාණය වැඩි වීම ලංකාවේ පුරරුෂයින් විදේශ රැකියා සඳහා පිටත් කර යැවීමට ගත් ප්‍රතිපත්ති වල ප්‍රතිඵලයක් ලෙස සැලකිය හැකිය.

## අයිතීන් සහ අඩුපාඩු හඳුනා ගැනීම

විදේශ රැකියාවන් සඳහා පිටත්වන කාන්තාවන් කෙරේ වැඩි අවධානයක් යොමු කිරීම කාන්තාවන් දුර්වල කොට්ඨාශයක් වශයෙන් සමාජය සැලකීම පෙන්වා දෙනු ලැබේ.

මෙය ලිංගික හිංසන වැනි අවස්ථා වලදී සත්‍යයක් විය හැකි බව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට කාන්තාවන්ගෙන් ලැබී ඇති පැමිණිලි 5801 සහ පුරුෂයින්ගෙන් ලැබී ඇති පැමිණිලි 1552 නුත් තහවුරු වේ.

එනමුත් පුරුෂයින් ලිංගික අතවර වලට ලක්වීම පිළිබඳ පැමිණිලි 70 ක් පමණ ලැබී ඇත. එසේම පැමිණිලි 59 ක් ලියාපදිංචි වී ඇත්තේ පිරිමි සේවකයින්ගේ මරණ සම්බන්ධයෙනි. ලියාපදිංචි කාන්තා සේවකයින් මරණයට පත් වීම පිළිබඳ පැමිණිලි 49 ක් ලැබී ඇත.[2] එනිසා පුරුෂයින් කිසිදු ආකාරයකින් කාන්තාවන්ට වඩා පහසු රැකියා පහසුකම් හෝ ඔවුන් පුරුෂයන් වීම නිසා අඩු අවදානම් සහිත කණ්ඩායමක් ලෙස හෝ සැලකිය නොහැක.

ඇත්ත වශයෙන්ම විදේශ රැකියා සඳහා යන පුරුෂයින්ට ඔවුන්ගේ පුරුෂභාවය හේතු කොට ගැටළු වලට මුහුණ දීමට සිදු වේ. විදේශ රැකියා බලාපොරොත්තු වන පුරුෂයින් හට ඒජන්සි වලට වැඩි ගාස්තුවක් ගෙවිය යුතු බැවින් ඔවුන්ට ණය වීමට සිදු වේ.[3] මෙම ගාස්තු ගෙවීම සඳහා වැටුප් වලින් මුදල් අය කර ගන්න ක්‍රම නිසාවෙන් ඔවුන්ගේ ආදායම අවම වේ.

සේවකයින් ලබා දෙන සමාගම් ඇඟලුම් කර්මාන්තය වැනි කර්මාන්ත සඳහා කාන්තාවන් කෙරේ වැඩි කැමැත්තක් දැක්වීම නිසා, එම රැකියා සඳහා පුරුෂයින් යොමු කිරීමේදී අය කිරීමක් කරනු ලබයි. මෙය පුරුෂ සේවකයින්ගේ තව දුරටත් ණය බර වැඩි වීමට හේතුවේ.

විදේශ රැකියා සඳහා පිටත් වන සේවකයින් සහ ඔවුන්ගේ පවුල් ආරක්ෂාව පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ පළමු වගන්තියට අනුව[4] 'විදේශගත සේවකයා' මුදල් ලබා ගැනීම සඳහා ඔහු හෝ ඇය ස්වදේශිකයෙක් නොවන රටක රැකියා කරන පුද්ගලයෙකු ලෙස අර්ථ දක්වා ඇත. එම සම්මුතියට විදෙස් සේවකයින් තවදුරටත් වර්ග කරමින්, විශේෂ වගන්ති තුළින් "නැව්කාරයින්" වැනි කොටස් ඉදිරිපත් කර ඇත. මෙහිදී ඉහත වගන්තියට ධීවරයින් අයත් වන අතර ඔවුන් විදෙස්ගතව තම රටේ ලියාපදිංචි නොවූ යාත්‍රාවක සේවය කරන පුද්ගලයෙකු ලෙස අර්ථ දක්වා ඇත. "අක් වෙරළාශ්‍රිත ප්‍රදේශයක නියුක්ත සේවකයින්" තම රටේ නොවන අක් වෙරළාශ්‍රිත කොටසක රැකියා කරන සේවකයින් ලෙසද, "ව්‍යාපෘති සහ සම්බන්ධ සේවකයින්" ඔවුන්ගේ සේවායෝජකයා යටතේ එම ව්‍යාපෘතිය සඳහා පමණක් එම විදේශ ප්‍රදේශයේ සේවයේ නියුක්ත සේවකයින්ය.

මෙම අර්ථ දැක්වීම් වල වැදගත්කම වචන වල අර්ථ වලින් ඔබ්බට යන්නකි. ඉහත කී සම්මුතියේ 57 වන වගන්තියට අනුව, අයිතීන් වල ස්වාභාවය මෙම අර්ථ දැක්වීම් වල කුමන කොටසට සේවකයා සහ එම සේවකයාගේ පවුල අයත් වේද යන්නෙන් තීරණය වේ.

තවද, තුන්වන වගන්තියට අනුව සම්මුතිය තුළින් පුහුණු වීම් කටයුතු සඳහා විදෙස්ගත වුවන් හෝ විදෙස් රට තුළ වැටුප් ලබා නොවෙසෙන "නැව්කාරයින්" හෝ "අක් වෙරළාශ්‍රිත ප්‍රදේශයක සේවයේ නියුතු සේවකයින්" ආරක්ෂා නොකෙරේ.

සංක්‍රමණික පුරුෂ සේවකයින්, විවිධ රැකියාවල නිරත වේ. එනම්, විශේෂ කුසලතා රහිත සේවකයින් ලෙසත්, ධීවරයින් හෝ කුලී ඉදිකිරීම් සහායකයින් ලෙසත් රැකියා වල නිරත වේ. ඔවුන් මෙම රැකියා වල නිරත වන්නේ ඉතා කටුක පරිසර සහ අවම පහසුකම් සහිතවය. 'කොරියාවේදී ඔවුන් ඔවුන්ගේ සේවායෝජකයාගේ රැකියා සම්බන්ධ රීති වලට අනුකූලවද, මැද පෙරදිග දී, විශේෂයෙන් සෞදි අරාබිය සහ කටාර් වැනි රටවලදී ගෙවීම් රහිතව අතිකාල සේවා සිදු කරනු ලබයි.'[5] ඔවුන්ගේ රැකියා ස්වාභාවය සම්බන්ධව නිසි අවබෝධයක් නොමැති

1 'Hundreds of Migrant Workers Return in Sealed Coffins', The Sunday Leader, October 5, 2014.

2 'Sri Lanka: Good Practices to Prevent Women Migrant Workers from Going into Exploitative Forms of Labour', Malsiri Dias & Ramani Jayasundere, GENPROM Working Paper No. 9.

3 United States Department of State, 2013 Trafficking in Persons Report - Sri Lanka, 19 June 2013.

4 UN General Assembly, International Convention on the Protection of the Rights of All Migrant Workers and Members of their Families, 18 December 1990, A/RES/45/158.

5 Supra note 2, at p. 10.

වීම හේතු කොටගෙන, ඔවුන් තුළ එම රැකියා සම්බන්ධ අයිතීන් රාමුව සම්බන්ධ අපැහැදිලිභාවයක් ඇති වීමට එය හේතු වේ. ඇතැම් අවස්ථා වල මෙය සේවකයාට ඇති අයිතීන් සම්පූර්ණ වශයෙන්ම අක්‍රීය වීමට හේතුපාදක වේ.

තවදුරටත්, බොහෝ අවස්ථාවල විදේශ රට වලට ඇතුළු වන අවස්ථා වලදී එම සේවකයින්ට ඔවුන්ගේ මූලික ගිවිසුම් අත්සන් කිරීමට සිදු වන අතර, එය ඔවුන්ගේ අයිතීන් සහ ඔවුන්ගේ රැකියා ස්වාභාවයට අහිතකර බලපෑම් ඇති කරනු ලබයි. එනිසා, අයිතීන් සම්බන්ධ ක්‍රමවේදයන් සහ ඒවාට අදාළ විවිධ රැකියා කාණ්ඩ පිළිබඳ නිසි අවබෝධයක් ඇති කර ගැනීම තුළින් දැනුම සහිතව තීරණ ගැනීමට සේවකයින්ට හැකියාව ලැබේ. මෙතුළින් ඔවුන්ගේ ආරක්ෂාව සහ පහසුකම් සහතික කර ගැනීමට ඔවුන්ට හැකියාව ලැබේ.

## සියල්ලන්ට අදාළ වන පුහුණු කිරීම්

විදෙස් රැකියා සඳහා පිටත්ව යන සේවකයින් එම විදෙස් පරිසරය තුළ තම කටයුතු සිදු කර ගැනීමට අදාළව පුහුණු වීම් ලබා ගැනීම අත්‍යාවශ්‍ය වේ. ඉතා වැදගත් ලෙස ඔවුන්ගේ නීතිමය අයිතීන් පිළිබඳ ඔවුන් පිටත් වීමට පෙර දැනුවත් කිරීම අත්‍යාවශ්‍ය වේ.

සම්මුතියේ 33 වන වගන්තියට අනුව ශ්‍රී ලංකාවෙන් පිටත් වන සේවකයින් හට සහ එම පවුල් වලට ලාංකීය රජයෙන් ඔවුන්ගේ අයිතීන් පිළිබඳව දැනුවත් කිරීමක් සිදු කළ යුතුය. මෙයට සම්මුතියෙන් ලබා දෙන අයිතීන්, ඔවුන් එම රටට ඇතුළු කර ගැනීම පිළිබඳ කොන්දේසි, එම රට තුළ ඔවුන්ට ඇති අයිතීන් සහ ඔවුන් පිළිපැදිය යුතු නීති පිළිබඳ අවබෝධයක් ලබා දීම තුළින් ඔවුන්ට එම රට තුළ පවතින පරිපාලන ක්‍රම වලට පහසුවෙන් හැඩ ගැසීමට හැකියාව ලැබේ. එම තොරතුරු විදෙස් රැකියා සඳහා පිටත්ව යන සේවකයින් මෙන්ම ඔවුන්ගේ පවුල් වලට ඉල්ලීම කළ විට නොමිලේ ඔවුන්ට අවබෝධ වන භාෂාවකින් ලබා දීමට හැකි විය යුතුය.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය මෙම තෙරතුරු ලබා දීමට නීතියෙන් බැඳී සිටී. එනමුත් රැකියා සඳහා විදේශගතව නැවත පැමිණෙන සේවකයින් කාර්යාංශය විසින් නිසි ලෙස එම තොරතුරු ලබා නොදෙන බවට චෝදනා එල්ල කර ඇත.[6]

ඊට අමතරව විවිධ රැකියා වලට ගැළපෙන පුහුණු කිරීම් වෙනුවට, බොහෝ විට කාන්තා ගෘහ සේවිකාවන් සඳහා සැකසුණු පුහුණු කිරීම් සිදු වේ. එසේම කාන්තාවන්ට මෙන් නොව පිරිමි සේවකයින්ට පුහුණු කිරීම් වලට සහභාගි වීම අත්‍යාවශ්‍ය බව ප්‍රකාශ කර නොමැත.

පිරිමි සේවකයින් සඳහා යොමු වූ එකම පුහුණු කිරීම මැහුම් යන්ත්‍රය ක්‍රියාත්මක කිරීම සම්බන්ධ පුහුණු කිරීමයි.[7] එනිසා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සේවක ආරක්ෂාව සහතික කිරීම සඳහා වැඩිපුර ක්‍රියාමාර්ග ගැනීම වෙනුවට පහසු, බහුතරයකට අදාළ පුහුණු කිරීම් සිදු කරන බව පෙන්නුම් කරයි. මෙය බහුතර කාණ්ඩයට අයත් නොවන සේවක ආරක්ෂාව සහ යහ පැවැත්ම සඳහා සෘජුවම බලපායි.

## අවධානම් කරුණු: දුක් විඳින්නාගේ සිට වරදකරුවා දක්වා

බොහෝ සංක්‍රමණික සේවකයින් මිනිස් අපනයන ජාවාරම් වලට ගොදුරු වේ.

සම්මුතියේ මිනිසුන් අපනයන ජාවාරම වැළැක්වීමට, අවම කිරීමට සහ එයට දඬුවම් ලබාදීම සම්බන්ධයෙන් ඇති 3 වන වගන්තියේ (අ) ඡේදයෙහි[8] මිනිස් අපනයන ජාවාරම, තර්ජනය, බල කිරීම, පැහැර ගැනීම, රැවටීම, තමා සතු බලය අනිසි ලෙස යොදා ගැනීම හෝ පුද්ගලයාගේ භාරකරුවන් ලෙස පෙනී සිටින්නන්ට මුදල් ලබා දී මිනිසුන් බඳවා ගැනීම, ප්‍රවාහනය කිරීම, ජාවාරම් සඳහා රැකවරණය දීම හෝ භාර ගැනීම වශයෙන් අර්ථ දක්වා ඇත. මෙහි භාරකරුවන්ට මුදල් දී පුද්ගලයන්ගෙන් අයුතු ප්‍රයෝජන ගැනීම තුළට ගණිකාවන් ලෙස යොදා ගැනීම, ලිංගිකව අයුතු ප්‍රයෝජන ගැනීම, බලෙන් වැඩ ගැනීම, වහල් සේවයේ යෙදවීම හෝ ඒ සමාන ක්‍රියා සහ ශාරීරික අවයව ලබා ගැනීම අයත් වේ.



Photo : ILO Apex Image

මිනිස් අපනයන ජාවාරම සේවකයින් රටින් පිටත් වීමට පෙර සිටම ක්‍රියාත්මක වන්නකි. මෙය බොහෝ විට සේවකයින් බඳවා ගැනීමේ සමාගම් තුළින් සිදුවන අතර, ඔවුන් බොහෝ විට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි ආයතන සහ එම ආයතන යටතේ පවතින ලියාපදිංචි නොවූ අනු සමාගම් වේ[9]. අදාළ රට තුළට ගිය පසු එම සේවකයින්ගෙන් අයුතු ප්‍රයෝජන ගන්නා අතර බොහෝ විට ලිංගික අතවර වල සිට බලාත් ශ්‍රමග්‍රහණය (බලෙන් වැඩ ගැනීම) දක්වා සිදු වේ.

මිනිස් අපනයන ජාවාරම බොහෝ විට පුරුෂ සහ ස්ත්‍රී දෙපක්ෂයටම බලපාන පොදු ගැටළුවකි. නමුත් නීතිමය නොවන ක්‍රම තුළින් මිනිසුන් ප්‍රවාහනය කිරීම බොහෝ විට පුරුෂයින්ට අදාළ වේ. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ, අන්තර්ජාතික සංවිධානාත්මක අපරාධ සම්බන්ධ සම්මුතියට සහ මිනිසුන් නීති විරෝධී ප්‍රවාහනයට එරෙහි කෙටුම්පතට[10] අනුව නීති විරෝධී ප්‍රවාහනය "රටක නීත්‍යානුකූල පුරවැසියෙක් හෝ ස්ථිර වැසියෙක් නොවන පුද්ගලයෙකු, මූල්‍ය හෝ වෙනත් ද්‍රව්‍යමය වාසි ලබා ගැනීමට, සෘජු හෝ වක්‍රාකාරයෙන් හෝ එකී රට තුළට පැමිණීම සම්පාදනය කිරීමේ ක්‍රියාවලියයි."

උදාහරණයක් වශයෙන් ධීවර බෝට්ටු යොදා තරුණ පිරිමින් ඉතාලිය, ජර්මනිය හෝ ඕස්ට්‍රේලියාව වැනි රටවලට යාමට උත්සාහ කිරීම හුවා දැක්විය හැකිය. මෙම ක්‍රියාවලීන් එම රටවලට ඇතුළත් වීමට වෙර දරන පුද්ගලයන්ගේ උවමනාවට පමණක් සිදු නොකෙරේ. මෙය සංවිධානාත්මක අපරාධ ව්‍යාපෘතිවල කුඩා කොටසකි. මේ සඳහා විදෙස්ගත වීමට බලාපොරොත්තු වන සේවකයින්ට ඉතා අධික මුදල් ප්‍රමාණයක් ගෙවා ඔවුන්ගේ ජීවිත පරදුවට තබමින් මිනිස් තොග වශයෙන් ප්‍රවාහනය වීමට සිදු වේ.[11]

මෙය ඉතා දුෂ්කර ආර්ථික ප්‍රශ්න නිසා ගත්තාවූ තීරණයක් වුවද, නීති විරෝධී ලෙස ප්‍රවාහනය තුළින් විදෙස්ගතව රැකියා කිරීමට

6 United States Department of State, 2013 Trafficking in Persons Report - Sri Lanka, 19 June 2013.

7 Supra note 2, at p. 10.

8 UN General Assembly, Protocol to Prevent, Suppress and Punish Trafficking in Persons, Especially Women and Children, Supplementing the United Nations Convention against Transnational Organized Crime, 15 November 2000.

9 Supra note 5.

10 UN General Assembly, Protocol against the Smuggling of Migrants by Land, Sea and Air, Supplementing the United Nations Convention against Transnational Organized Crime, 15 November 2000

11 Supra note 2, at p. 15.

බලාපොරොත්තු වන පුද්ගලයින් සහ පුද්ගල අපනයන ජාවාරම් වලට ගොදුරු වූවන් දෙආකාරයකින් සමාජයේ දක්නට ලැබේ. මෙයට හේතුව පුද්ගල අපනයන ජාවාරම් වලට ලක්වූවන් වංචාට ගොදුරු වූවන් ලෙස සැලකීමයි.

අනෙක් අතට, නීතිවිරෝධී මිනිස් ප්‍රවාහනයට සහභාගී වන්නන්, නීති විරෝධීව ක්‍රියා කරමින් විදෙස් රටකට ඇතුළු වීමට සිය කැමැත්තෙන්ම සහභාගී වේ. එනිසා විදෙස් රටකට ඇතුළු වන මොහොතේම එම පුද්ගලයා නීතිය කඩ කර ඇත. එනිසා මෙම පුද්ගලයින්ගේ අයිතීන් ආරක්ෂා කිරීම වඩා දුෂ්කර කාර්යයක් බවට පත් වී තිබේ. මෙයට හේතුව එම පුද්ගලයන් වංචා වලට ගොදුරුවූවන්ම නොවන නිසා සහ ඔවුන් නීතිය කඩ කර තිබීම නිසාය. කෙසේමුත් මෙම පුද්ගලයන්ගේ සාවද්‍යතාව (දඬුවම් ලැබිය යුතු බව) හේතු කොට ගෙනම මෙම ක්‍රියාවලීන් තුළ විදෙස්ගත වන සේවකයින්ගේ අයිතීන් පිළිබඳ පවතින ප්‍රතිපත්ති කෙරේ අවධානය යොමු කිරීම අවම වේ. නමුත් මෙම පුද්ගලයින් ලාංකිකයන් වන බැවින් ඔවුන්ගේ වගකීම එම පුද්ගලයාට මෙන්ම රජයටද පැවරේ.

## හිස්තැන් පිරවීම

මෙම ලිපියෙහි පරමාර්ථය කාන්තාවන් මුහුණ දෙන්නාවූ ගැටළු සැහැල්ලුවට ලක් කිරීම නොවේ. එනමුත්, බොහෝ කලක සිට විදෙස්ගත සේවකයාගේ කතාව හෝ විස්තරය තුළ පුරුෂ පක්ෂය නිරන්තරයෙන්ම තම බිරිඳ විදේශ රටක සිට මහන්සි වී උපයා එවන මුදලින් මත්පැන් පානය කරමින් තම දරුවන්ට වධ දෙන්නාවූ වරදකරුවකු ලෙස දකී. විදෙස්ගත වන පිරිමි සේවකයින් පිළිබඳව සිදු කර ඇති පර්යේෂණ ඉතා අල්පය. මෙහි යථාර්ථයට ලංවූ වෘත්තාන්තරයක් ඉදිරිපත් කිරීමට ඇති කාලය ගෙවී ගොස් ඇතිමුත්, විදෙස්ගත වන පුරුෂ සේවකයින් පිළිබඳ අවදානය යොමු කිරීම සිදු කළ යුතුය. ඔවුන්ද කාන්තාවන් මෙන්ම ආරක්ෂාව සහ අයිතීන් ලැබිය යුතු සේවක පිරිසකි.

**විශාඛා විජේනායක**[12]

12 LLM Candidate (University of Michigan); Attorney-at-Law; LLB (University of Colombo)

## නීතියට ඵලදායක සමාජ වෙනස්කමක් ඇතිකළ හැකිද? 'රත්නපුර බට්ටිගේ' කුතුහලය දනවන වෘත්තාන්තය

එක් මසකට පමණ පෙර ජංගම දුරකතනයක වීඩියෝගත කළ දර්ශන ශ්‍රී ලංකාව පුරාම පැතිර ගියේය. එහි පොලිස් නිළධාරියෙකු එක්තරා (ගණිකාවක් ලෙස සඳහන් වන) කාන්තාවකට බඳ පටියකින් හෝ එවන් වෙනත් පටියකින් රත්නපුර බස් නැවතුම් පොළේදී නොනවත්වා පහර දෙන අයුරු දිස්වේ. විවිධ මාධ්‍යය ජාල වල පැතිර ගිය පසු මෙම දර්ශන පොදු විවාදයකට මුල් වූ අතර, එතුළින් එම පොලිස් නිළධාරියා හඳුනා ගෙන ඔහුගේ සේවය අත්හිටුවීමටද, එම කාන්තාවට ඔහුට විරුද්ධව මූලික අයිතිවාසිකම් නඩුවක් ගොනු කිරීමටද සහාය ලැබුණි.

"රත්නපුරේ බට්ටි" (යන නමින් ප්‍රසිද්ධ වී ඇති ඇය) ගේ සිදුවීම පොලිස් සේවය තුළ පවතින දූෂණය, ප්‍රචණ්ඩත්වය පෙන්නුම් කරන අතරම, "පිළිගත් සමාජයට" අයත් සමහර පුද්ගලයන් විසින් පවා ගණිකාවක් සහ මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවෙකු ලෙස තමන් විසින්ම පිළිගත් පුද්ගලයෙකුට වඩා ප්‍රචණ්ඩ පොලිස් නිළධාරියෙකුට සහාය දීමට යොමු වීම තවත් එක් කණගාටුදායක නිදර්ශනයකි.

කෙසේ නමුත් මෙම සිදුවීම තවත් හේතුවක් නිසා වැදගත් විය හැකිය. ඇය සිය සත්‍ය කතාව පැවසීමට නොබියව ඉදිරිපත් වීම හැරුණු කොට ගෙන, 'බට්ටි' ගේ සිදුවීම තුළින් සමාජයේ නිගාවට ලක්වන (කොන් කරනු ලැබූ) පුද්ගලයින් හට සිය අයිතීන් වෙනුවෙන් කතා කිරීමට සහ සවන් යොමු කරවා ගැනීමට නීතියෙන් සිදු විය යුතු කාර්යභාරය සහ විශේෂයෙන්ම අධිකරණය තුළ ඉඩක් ලබා ගැනීමේ ඇති වැදගත්කම පිළිබඳ ප්‍රශ්නය ඉස්මතු කර දක්වයි. 'බට්ටි' ගොනු කර ඇති මූලික අයිතිවාසිකම් නඩුව තුළින් ඇයට සාධාරණත්වයක් ඉටුවේද, නොවේද යන්න පිළිබඳව තවමත් නිශ්චිත පිළිතුරක් නොමැත (බොහෝ පුද්ගලයන් ජනවාරි මස එම නඩු විභාගය පිළිබඳව අවධානය යොමු කරනු ඇත). ඒ අතරතුර, ඇයගේ මෙම සිදුවීම නීති ක්ෂේත්‍රයේ නියුතුව සිටින්නාවූ අප හට, නීතිය සමාජමය ක්‍රියාවාදයන් සඳහා භාවිතා කිරීමේ වාසි, අවාසි පිළිබඳව මෙනෙහි කිරීමට අවස්ථාවක් ලෙස සැලකිය හැකිය.

පසුගිය වසර 60+ කාලය තුළ මානව අයිතිවාසිකම් ක්ෂේත්‍රය මහත් පරිශ්‍රමයකින් මූලික අයිතිවාසිකම් සුරැකීමට නීතිමය රාමුවක් සහ ක්‍රියාදාම ගොඩනැගීමට කටයුතු කර ඇත.



**Photo : Benzene Aseel**

මෙම ප්‍රවේශය සම්බන්ධ අද්වකාත්වරු පවසනුයේ නීතිය 'බලය උදෙසා සත්‍ය' කතා කිරීමේදී බලවත් මෙවලමක් විය හැකි නීත්‍යානුකූලභාවය සහ අධිකාරිත්වය පිළිබඳ හරයන් සපයන බවයි. විචාරකයන් මෙයට ප්‍රතිචාර වශයෙන් දක්වනුයේ, නීතිය එහි ස්වාභාවයෙන්ම ගතානුගතික බවත්, පවතින බල ව්‍යුහයට සබැඳි බවත්ය. එනිසා නීතියට සමාජ වෙනස්කම් සිදු කිරීම අපහසු බව පවසයි.

ආනුභාවික පර්යේෂණ වලට අනුව සමාජයෙන්, දේශපාලනඥයින් විසින් සහ රාජ්‍ය සංවිධාන වලින් නොසලකා හරින ලද පුද්ගලයන්ට නීතියෙන් අවස්ථාව ලබා දී ඇති උදාහරණ පෙන්නුම් කරයි.

ඉන්දියාවේදී, බොහෝ විට නොවැදගත් ලෙස කොන් කරන ලද කණ්ඩායම් විසින් තම අයිතීන් තහවුරු කර ගැනීමට නීතිය භාවිතා කර ඇත. *හුසෙයිනරා ඛටූන් සහ වෙනත් එ. බිහාර් ප්‍රාන්ත මහා ලේකම් [1979] ඒ.අයි.ආර්. 1369,* නඩුවේදී මහාධිකරණය විසින් සිරකරුවන්ට නොමිලේ නීතිමය සහාය මෙන්ම කඩිනම් නඩු විභාග යක්ද ලබා දෙමින් ඔවුන්ගේ අයිතින් තහවුරු කරන ලදී. එසේම, ඇමරිකාවේ වෙනස්කොට සැලකීමට විරුද්ධව පැවති නඩු විභාග යන් පිළිබඳ අධ්‍යයනයකදී, පැමිණිලිකරුවන් එම නඩු විභාගයේදී අසමත් වුවද, එතුළින් සමාජයේ පොදු විවාද ඇති කර, පසුව සමාජ වෙනස්කම් තුළින් පොදු අදහස වෙනස් කිරීම කෙරේ යොමු වූ බව දැකගත හැකිය.

ඒ හා සමානවම, නව අධ්‍යයනයකදී, චීන පැමිණිලිකරුවන් විසින් නව 'නීතිමය පාලනය' පිළිබඳ ප්‍රතිසංස්කරණය යොදා, පාලක සහ වෙනත් ආකෘතිමය ව්‍යූහ වල ඇති අයුක්ති සහගත දේවලට එරෙහිව කටයුතු කළ අතර, එතුළින් ඔවුන්ට ජය නොලැබුණද, එම ක්‍රියාවලිය තුළින් ඔවුන්ට ශක්තිමත්භාවයක් ඇති වූ බව පෙන්නුම් කරයි. ඔවුන්ගෙන් පුද්ගලිකව ලබාගත් කරුණු හැරුණු කොට, අධිකරණය තුළ සමාජ ක්‍රියාදාමයට සහ දේශපාලන සහභාගිත්වයට නව මුහුණුවරක් ලබා දුනි.

එසේම කාන්තාවාදී නීති විශේෂඥයින් පවතින ක්‍රමය වෙනස් කිරීමට නීතියට ඇති හැකියාව පිළිබඳ සැක මතු කර ඇත. මගේ පුද්ගලික වෘත්තීයමය අත්දැකීම් වලට අනුව, ජාතික සහ අන්තර්ජාතික ස්ත්‍රී දූෂණ නඩු විභාග තුළින් සාධාරණයක් ලැබෙන්නේ කාන්තාවන් එක්තරා චරිතයක් තුළ සිටි විට පමණි. එනම්, 'ආදර්ශ දූෂණ ගොදුරෙහි' චරිතය දක්වන්නන් පමණි.

මෙයින් (සමහර අවස්ථා වලදී) සුදුසු නීතිමය ප්‍රතිඵල ලබා දුන්නත්, බොහෝ අවස්ථා වලදී නියමිත ආකාරයට ඔවුන්ගේ දූෂණ අත්දැකීම හෝ අනන්‍යතාවය හඳුනාගැනීමට අපොහොසත් විය හැක. එසේම මෙම නඩු විභාග තුළින් දූෂණයට ලක්වූවන් මානසිකව ශක්තිමත් කිරීමට හෝ සමාජීය අවිචාරක හැඟීම්, මතවාද වලට අභියෝග කිරීමට හෝ හැකියාවක් නොමැත.

අධිකරණය ක්‍රියාත්මක වන්නේ සමාජ රික්තයන් තුළදී නොවේ. ලාංකීය සමාජයීය උස් පහත් භාවය නිසා නීතිය තුළින් කෙයියම් හෝ ආකාරයකින් ඔවුන්ගේ අයිතීන් තහවුරු කළ හැකි වුවද, එය කොන් කළ හෝ පහත් කළ පුද්ගලයින්ට සාධාරණයක් ඉටු කරනු දක්නට නොලැබේ.

මෙම තත්ත්වය පුනරාවර්ථව සත්‍ය වන බව මගේ පර්යේෂණ තුළින් අධ්‍යයනය කර ඇත. විශේෂයෙන් පොලීසිය සහ මානුෂික අයිතිවාසිකම් සැලකූ විට මෙය දැකගත හැක. ප්‍රචණ්ඩත්වයට, ආක්‍රෝෂයට හෝ අයථා සැලකීම් වලට මුහුණ දෙන්නන් සමාජයට අදිසිය. එනිසා නීති පැවතියද එම නීති තුළින් සමාජීය පිටුවහලනයට උදව් කිරීමට සිතෙනුයේ කිහිප දෙනෙකුට පමණි. මෙය 'බට්ටි' පැහැදිලිවම දන්නා කරුණක් බව සහතිකය. එනිසා ඇය ලැබුණු ප්‍රතිචාර පිළිබඳ සතුටට මෙන්ම පුදුමට පත් වන්නට ඇත.

මෙම හේතුව නිසා මානව අයිතිවාසිකම් සම්බන්ධ ප්‍රජාව විසින් අධිකරණය මෙන්ම නඩුව විභාග කිරීම ගැන පුදුමයට මෙන්ම සතුටට පත්ව ඇත. මෙය අධිකරණය ව්‍යාවස්ථවේ 3 වන පරිච්ඡේදය යටතේ පවතින ඔවුන්ගේ වගකීම් ඉටු කිරීමට උත්සාහ කරන බවට සුළු නමුත් ශුභවාදී සලකුණක් ලෙස ගත හැකිය. නිතිය 'බට්ටි' ගේ සිදුවීම සම්බන්ධව පොදු අවධානය යොමු කිරීමට හෝ ඇයට සහන සැලසීමට හේතු වී නැත; එය සමාජ මාධ්‍යය තුළින් සිදු වූවකි.

කෙසේ නමුත් නීතිය 'බට්ටි' හට ඇයගේ අයිතීන් (බොහෝ විට කල්පිතයක් ලෙස පවතින) ලබා ගැනීමට අවස්ථාවක් ලබා දෙන බව දක්නට ලැබේ. මෙය 'බට්ටි' ට පමණක් නොව ලංකාව තුළ මානව අයිතිවාසිකම් රැකීමේ පරිසරයටද රුකුල් දෙන්නකි. මෙයින් බොහෝ අවස්ථාවල සමාජීය යුක්තිය ඉටු කිරීමේ පොරොන්දුව කඩ කරන නීතිමය ක්‍රමයක් තුළ වුවද, වෙනත් සමාජ ක්‍රමවේද තුළින් හා ඒ සමඟ නීතිමය කටයුතු කිරීමෙන් පුද්ගලයින්ට ඔවුන්ගේ අයිතීන් තහවුරු කර ගැනීමට හැකි බව පොදු විවාද වලට ඉදිරිපත් කළ යුතුය.

මෙය මතකයේ තබා ගෙන, නිගමනය කුමක් වුවත් 'බට්ටි' ගේ මූලික අයිතිවාසිකම් පෙත්සම විශේෂ අනාගත ඉඩ ප්‍රස්ථාවක් ලබා දී ඇත. මෙය සමාජයේ කොන් කළ පුද්ගලයෙකුට පුරවැසියෙකු ලෙස හැගෙන අවස්ථාවක් පමණක් නොව, සැමගේ අයිතීන් රැකීමට (සමාජ සම්මුතියෙන් පිට සිටින්නන් ඇතුළුව) ඇති යුතුකම පිළිබඳ සංවාද ගොඩ නැඟීමටත්, ඊට විරුද්ධමතවාද වලට අභියෝග කිරීමටත් ඇති අවස්ථාවකි.

එසේම මෙම සිදුවීම අනුකම්පාවට පමණක් සීමා වූවක් නොකර සමාජයේ පන්ති, ලිංගභේද සහ සදාචාරය ගොඩ නැගීමට අවස්ථාවක් විය යුතුය. එනිසා මෙම සිදුවීමේ විශේෂත්වය සමාජයේ ඵලදායක වෙනස් වීම් කිරීමට එයට ඇති හැකියාව මෙන්ම 'බට්ටි' ගේ අයිතීන් සුරැකීමටද වැදගත් වේ.

**ආචාර්ය කිරන් ග්‍රෙවාල්** [1]

---

1 Human rights lawyer, Researcher at the Australian Catholic University (ACU) Institute of Social Justice, Faculty Member at ACU, School of Education & Arts

# ශ්‍රී ලංකාවේ ධීවරයින්ගේ ජීවනෝපායන් රැක ගැනීම සඳහා - පතුල් ට්‍රෝලනය (බොටම් ට්‍රෝලිං) නවතනු

> පතුල් ට්‍රෝලනය යනු සමුද්‍රීය ජීවීන්ගේ පැවැත්මට සහාය වන කොරල්පර වලට අනපේක්ෂිත අයුරින් හානි පමුණුවන භයානක ක්‍රියාවලියකි. එය ප්‍රෝටීන් රාත්තල් කිහිපයක් ලබා ගැනීමේ පරමාර්ථයෙන් මුළු පරිසර පද්ධතියම විනාශයට පත් කරමින්, සමනලයෙකු ඇල්ලීමට බුල්ඩෝසරයක් යොදා ගත්තා හා සමානය. අපි මෙය පොළවේදී සිදු නොකරමු නම්, සාගරයේදී එය සිදු කරනුයේ මන්ද?
>
> සිල්වියා අර්ල්, එ.ජ. ජාතික සමුද්‍රීය හා වායුගෝලීය පරිපාලනය පිළිබඳ හිටපු ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ

ශ්‍රී ලංකා දියඹ තුළ යාන්ත්‍රීය පතුල් ට්‍රෝලනය සිදු කිරීම සමුද්‍රීය සම්පත් සංරක්ෂණය හා ආරක්ෂණය සඳහා තර්ජනයකි. මෙලෙස ශ්‍රී ලංකාවේ උතුරු මුහුදු තීරය අයුතු ලෙස අල්ලා ගනිමින් යාන්ත්‍රීය පතුල් ට්‍රෝලනය ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබන්නේ ඉන්දියානු ධීවරයන් විසිනි. 2014 අප්‍රේල් මාසයේදී වාර්තා වී ඇති පරිදි ඉන්දියානු ට්‍රෝලර් යාත්‍රාවන් 2000 කට ආසන්න ප්‍රමාණයක් මුහුදු සීමාවන් තරණය කරමින් ශ්‍රී ලංකානු දියඹට පැමිණ ඇත. මේ අයුරින්ම ශ්‍රී ලංකානු දියඹ තුළ පතුල් ට්‍රෝලනය සිදු කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකානු ධීවරයින් හටත් නඩු පවතී.

පතුල් ට්‍රෝලනය යනු අධික බරැති විශාල දැල් භාවිතා කරමින්, මුහුදු පතුල හරහා එය ඇදගෙන යමින් මසුන් අල්ලන්නාවූ ක්‍රමවේදයකි. මෙම මසුන් ඇල්ලීමේ ආම්පන්නය කෝන් එකක හැඩයෙන් යුත් කෙළවර කඹයකින් ඇදගෙන යන, එහි අග කොටස අල්ලාගත් මසුන් රඳවා ගත හැකි පරිදි ගුලියක් බඳු ආකාරයෙන් පවතින්නකි. යාන්ත්‍රික කරණය වූ පතුල් ට්‍රෝලනය පරිසර පද්ධතියට අති විශාල වශයෙන් හානි පමුණුවන, පවත්වාගෙන යා නොහැකි (අස්ථායී) මසුන් ඇල්ලීමේ ක්‍රියාමාර්ගයකි:

1. සමුද්‍රීය වාසභූමියට හානි සිදු වීම - මසුන් ඇල්ලීමේ ආම්පන්න වලින් කොරල්පරයන් හැරීම, මුහුදු පත්ලෙහි වාස භූමි විනාශයට පත් කිරීම සිදු කරනු ලබයි. මේවා ලොකු මසුන් විසින් බිත්තර දැමීම සඳහා භාවිතා කරන සහ කුඩා මසුන් (පැටවුන්) සෙවණ සහ රැකවරණය සොයන ස්ථාන වේ.

2. නාස්තිය - ට්‍රෝලර් මඟින් කිසිදු තෝරා ගැනීමකින් තොරව සහ වගවිභාගයකින් තොරව එයට හමුවන සෑම ජීවියෙක්වම සහ වස්තූන් හසු කරගනු ලබයි. සුළු පරිමාණ ධීවර කර්මාන්තය ආශ්‍රිතව දශක ගණනක අත්දැකීම් බහුලව සේවය කරන, මත්ස්‍ය කර්මාන්ත ජීවවිද්‍යාඥ වන ආචාර්ය ස්ටීව් ක්‍රීච් ට අනුව, පතුල් ට්‍රෝලනය මඟින් අල්ලනු ලබන සෑම කුනිස්සන් රාත්තලක් අතරටම, රාත්තල් දහයක් පමණ සමුද්‍රීය සම්පත් ප්‍රමාණයක් 'අතුරු - ඇල්ලීම්' වශයෙන් ඉවතලනු ලබයි.

3. සම්පත් ප්‍රමාණය අඩු කිරීම - ආචාර්ය ස්ටීව් ක්‍රීච් විසින් තවදුරටත් විස්තර කරන අන්දමට, පතුල් ට්‍රෝලනය මඟින් නිරන්තරයෙන්ම කරනු ලබන බැහැර කිරීම් තුළ ඉතා වටිනා කුඩා ජීවී විශේෂ ඇතුළත් වන අතර, මෙහි ප්‍රතිඵලය වනුයේ, එම ජීවීන් පරිණත තත්ත්වයට පැමිණීමේ ඉඩකඩ වළකාලනු ලැබීමයි. එලෙසම මෙය එම ජීවීන්ට නැවත නිෂ්පාදනයන් කිරීමේ හැකියාව වළකාලනු ලබන අතර, ඒ තුළින් දිගු කාලීනව මෙම ජීවීන්ගේ ගහණය (ප්‍රමාණය) ට බලපෑම් සිදු වේ.

මෙම යාත්‍රා වල විනාශකාරී බලපෑම් අවසානයේදී සමුද්‍රීය සම්පත් මත යැපෙන ධීවරයින්ගේ ජීවනෝපායන්ද විනාශ කර දමනු ලබයි. විශේෂයෙන්ම උතුරේ ධීවරයින්, මෙයින් දැඩි ලෙස බලපෑමට ලක්ව ඇත. මන්ද එය ශ්‍රී ලංකාවේ දියඹ ක්‍රම ක්‍රමයෙන් අල්ලා ගනු ලබන ඉන්දීය ධීවරයින් සමග සම්පත් සඳහා තරග කිරීමට ඔවුන්ට බල කරන බැවිනි. 2013 වන විට, ශ්‍රී ලංකාවේ පවුල් 192,000 ක් පමණ ජීවත් වීමේ මාර්ගය වශයෙන් ධීවර කර්මාන්තය මත යැපෙමින් සිටියහ. පවුල් 41,000 ක් උතුරු පළාත පදනම් කොට ගෙන පමණක් පැවතිණි.




**Photo : Denish C**

සමුද්‍රීය සම්පත් සංරක්ෂණය කිරීමේ රාජකාරිය අන්තර්ජාතික නීති සම්පාදනයන්ගේද අන්තර්ගත වී ඇත. ඒවා නමින්, එක්සත් ජාතීන්ගේ සමුද්‍රීය නීතිය පිළිබඳ සම්මුතිය (UNCLOS) සහ එක්සත් ජාතීන්ගේ මත්ස්‍ය තොග පිළිබඳ සම්මුතිය (UN Fish Stocks Agreement) වේ. මෙම රාජකාරි තුළට පාරිසරික වශයෙන් සුරක්ෂිත ධීවර ආම්පන්න වල ප්‍රයෝජ්‍යකරණය සහ ජෛව විවිධත්වය රැක ගැනීමට ක්‍රියා කිරීම, නාස්තිය හා බැහැර කිරීම් අවම කිරීම මෙන්ම විනාශකාරී මසුන් ඇල්ලීමේ ක්‍රියාකාරකම් තහනම් කිරීම ආදිය අන්තර්ගතය.

ශ්‍රී ලංකාව ඉහත සඳහන් අන්තර්ජාතික සම්මුතීන් වලට අත්සන් තැබූවකු වශයෙන්, තම ධීවර ක්‍රියාකාරකම් එහි ඇතුළත් වන සංරක්ෂණ සහ කළමණාකරණ මිනුම් වලට අනුකූලව පවත්වාගෙන යන බව තහවුරු කිරීමට වගකීමක් පැවරී ඇත.[1]

ගැටළුව වනුයේ, සමුද්‍රීය සම්පත් මත වන බලපෑම පිළිබඳව අවධානය යොමු කරමින් - යාන්ත්‍රීය පතුල් ට්‍රෝලනයට විරුද්ධව සමුද්‍රීය පරිසරය ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකාව පියවර ගෙන ඇත්තේ කෙසේද? යන්නයි.

වර්තමාන ව්‍යාවස්ථාමය තන්ත්‍රය තුළින් පවසන පරිදි ධීවරයින් (දේශීය සහ විදේශීය) ශ්‍රී ලංකා දියඹේ ධීවර කටයුතු වල නිරත වීම සඳහා බලපත්‍ර/අවසරය ලබා ගැනීම අත්‍යාවශ්‍යය.[2] ධීවර යාත්‍රා ශ්‍රී ලංකාවේ සාගරයෙහි, වෙරළාශ්‍රිත දියඹෙහි සහ මෝයෙහි ට්‍රෝලර් ක්‍රියාකාරකම් වල නිරත වීමට වෙනමම බලපත්‍රයක් ලබා ගත යුතුවේ.[3] කෙසේවෙතත්, බලපත්‍ර රට තුළ පවතින ජලාශ (සාමාන්‍ය ගංගාව,

1 ශ්‍රී ලංකාව 1982 දෙසැම්බර් 10 වන දින UNCLOS හි අත්සන් තැබූ අතර 1994 ජූලි 19 වන දින සම්මුතිය ස්ථිර කරන ලදී. ශ්‍රී ලංකාව එ.ජා. මත්ස්‍ය තොග පිළිබඳ සම්මුතියට 1996 ඔක්තොම්බර් 9 වන දින අත්සන් තැබූ අතර සම්මුතිය 1996 ඔක්තෝම්බර් 24 වන දින සම්මුතිය ස්ථිර කරන ලදී.

2 දේශීය ධීවර බෝට්ටු 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනත යටතේ බලපත්‍ර ලබා ලත යුතු අතර, විදේශීය බෝට්ටු 1979 අංක 59 දරන ධීවර (විදේශීය ධීවර යාත්‍රා පිළිබඳ රෙගුලාසිය) පනත යටතේ බලපත්‍ර ලබා ගත යුතුය.

3 අතිවිශේෂ ගැසට් අංක 948/25, 1996

විල, කලපුව, ඇළ දොළ, වැව, පොකුණ, දිය මාර්ග සහ නැවුම් හෝ කිවුල් ජලය එන අනෙකුත් පොදු ප්‍රදේශ) වලට සපයනු නොලබයි. මෙම ව්‍යාවස්ථාමය සම්පාදනයන් පෙන්වා දෙන පරිදි රට තුළ පවතින ජලාශ හැර, ශ්‍රී ලංකා දියඹේ පතුල් ට්‍රෝලනය සිදු කිරීම පැහැදිලිවම තහනම් කරන ලද ක්‍රියාවක් නොවේ. ඒ වෙනුවට, එය බලපත්‍ර මඟින් පාලනය වන ක්‍රියාකාරකමකි.

හේතු සාධකයන් කිහිපයක් හමුවේම මෙම ක්‍රියාකාරකම පාලනය කිරීමේදී ස්ථිරසාර අර්ථයක් ලබාදීමට බලපත්‍ර ක්‍රමය සම්පූර්ණයෙන්ම අප්‍රමාණවත් තත්ත්වයට පත් වී ඇත. ඇතැම් අවස්ථා වල අවශ්‍ය බලපත්‍ර නොමැතිව ට්‍රෝලර් යාත්‍රා භාවිතා කිරීම සඳහා දේශපාලනික බලපෑම් දිගින් දිගටම යොදා ගැනීම හේතුවෙන් මෙම ට්‍රෝලර් යාත්‍රාවන් පාලනය කිරීම අපහසු වී ඇත. නියමිත පාලනයක් සහ අධීක්ෂණ යාන්ත්‍රණයක පවතින අඩුපාඩුව නිසාවෙන්, ට්‍රෝලර් යාත්‍රාවන් ඇත්ත වශයෙන්ම විධිමත් බලපත්‍ර සහිතව මසුන් ඇල්ලීමේ නිරත වන්නේද යන්න පරීක්ෂා කිරීමට සහ නිශ්චය කර ගැනීම අපහසු කර්තව්‍යයක් වී ඇත.

හොංකොං, නවසීලන්තය සහ බෙලීස් වැනි වෙනත් රටවල පතුල් ට්‍රෝලනය මුළුමනින්ම තහනම් කර ඇති අතර, එයින් ඔවුන්ගේ සමුද්‍රීය සම්පත් වල ස්ථිරසාරත්වයට වඩාත් හිතකර ප්‍රතිඵල උදාවී ඇත. මෙයට සමානවම, ශ්‍රී ලංකාව තුළද පතුල් ට්‍රෝලනය තහනම් කිරීම, එනම් සෑම ශ්‍රී ලාංකීය ජලාශයක් තුළම නීතිමය නියෝගයක් මාර්ගයෙන් මෙම ක්‍රියාවලිය තහනම් කිරීම, ශ්‍රී ලාංකීය හා ඉන්දියානු ට්‍රෝලර් යාත්‍රාවන් හමුවේ වන ගැටළුවට හොඳම විසඳුම විය හැකිය:

- ශ්‍රී ලාංකීය ට්‍රෝලර් යාත්‍රා - පතුල් ට්‍රෝලනයේ නිශ්චිත තහනමක් තුළින්, බලපත්‍ර යාන්ත්‍රණය ඉවත් කර දැමිය හැකිය. මෙය වර්තමානයේ පවතින අවපාලනය සහ දුර්වල පාලන ක්‍රියාකාරකම් සමඟ බැඳුණු ප්‍රශ්න විසඳීමට ඉවහල් වනු ඇත. මෙයින් දේශපාලනික බලපෑම් වලින් ට්‍රෝලර් යාත්‍රාවන් සඳහා බලපත්‍ර ලබා ගැනීමේ සහ අවසර ලබා ගැනීමේ ක්‍රියාවන් අඩු වනු ඇති අතර, ඒ නිසාවෙන්ම පළමුවෙන්ම ශ්‍රී ලංකා දියඹේ ට්‍රෝලර් යාත්‍රාවන් නොපැවතිය යුතුය.
- ඉන්දියානු ට්‍රෝලර් යාත්‍රා - එක්සත් ජාතීනගේ සමුද්‍රීය නීතිය පිළිබඳ සම්මුතිය (UNCLOS) මඟින් එක්සත් ජනපදයේ ධීවර කටයුතු වෙනත් රාජයන්ට අයත් සාගර වල සිදු කිරීමට නියම කරනු ලබයි. ඒ එක්සත් ජනපදය විසින් පනවන ලද සංරක්ෂණ මානයන්ට අනුකූල වීම පිණිසය.[4] ඉන්දියාව UNCLOS හි අත්සන් තැබූවකු ලෙස, මෙම සම්මුතියෙහි විධිවිධානයන්ට යටත් වීමට බැඳී සිටී.[5] ඉන්දියානු ප්‍රතිපූරණයත් සමඟ සිදු කරන හුවමාරු සහ ඉන්දියානු යාන්ත්‍රීය පතුල් ට්‍රෝලර් (බොටම් ට්‍රෝලිං) යාත්‍රා ශ්‍රී ලංකා සාගරයේ ධීවර කටයුතු වල නිරත වීම අත්හිටුවීමට යෝජනා කිරීමක් වශයෙන් ශ්‍රී ලංකාවට සමුද්‍රීය සම්පත් වල සංරක්ෂණය පිළිබඳ පදනම් භාවිතා කළ හැකිය. මේවා සිදු කිරීමට අපොහොසත් වීම තුළින් සමුද්‍රීය සම්පත් වල පාරිසරික ආරක්ෂාව පිළිබඳ පදනම් මත අන්තර්ජාතික ක්‍රියාමාර්ග ගැනීමට ඉඩකඩ සලසා දිය හැකිය.

මෙම යාත්‍රා වල විනාශකාරී බලපෑම් වල ප්‍රතිඵලයක් වශයෙන් ධීවරයන්ට ඔවුන්ගේ වර්තමානයේ පවතින සම්පත් අහිමි වීම සහ සමුද්‍රීය සම්පත් පුනර්ජනනය වීම නවතනු ලබන අතර, එයින් ධීවරයින්ට අනාගත සම්පත් පවා අහිමි කරනු ලබයි. මෙම ධීවරයින්ගේ ජීවනෝපායන් ආරක්ෂා කිරීමට පවතින වඩාත් සඵලදායී ක්‍රියාමාර්ගය විය හැක්කේ පතුල් ට්‍රෝලනය තහනම් කිරීම පිණිස නීතිමය ක්‍රියා මාර්ග ගැනීමයි.

**විද්‍යා නතානියෙල්[6]**

4 UNCLOS 61(4) වගන්තිය

5 ඉන්දියාව 1982 දෙසැම්බර් 10 වන දින UNCLOS හි අත්සන්කරුවකු වූ අතර, 1995 ජුනි 29 වන දින සම්මුතිය ස්ථිර කරන ලදී.

6 බබර් (ලන්ඩන් විශ්ව විද්‍යාලය), නීතිඥ සහ වෙරිටේ රිසර්ච්හී විශ්ලේෂකවරියකි.

# ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන්ගේ තත්ත්වය පිළිබඳ දළ විශ්ලේෂණය



**Photo : Meena Kadri**

අධ්‍යාපනය, සෞඛ්‍යය, රැකිරක්ෂා, ප්‍රවාහන සහ විවේකය යන අංශයන්ගේ සිට පහසුවෙන් ප්‍රවේශ විය නොහැකි බව සහ ගොඩනැගුණු පරිසරය දක්වා ආබාධ සහිත පුද්ගලයන්ගේ අවශ්‍යතාවන් පිළිබඳව අවධානය යොමු කළ යුතු අංශ ගණනාවක් පවතී.

තිස් වසරක යුද්ධයෙන් පසු මෙලෙස ආබාධිත තත්ත්වයේ පසු වන පුද්ගලයන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමෙන් වැඩි වී ඇත. මොවුන්ගේ තත්ත්වයන් නඟා සිටුවීමට සහ වැඩි වර්ධනය කිරීමට විවිධ වූ උත්සාහයන් ගනු ලැබුවත්, ආබාධ සහිත පුද්ගලයන්ගේ පොදු දුක් ගැනවිලි තවමත් එලෙසින්ම ඉතිරිව පවතී.

## ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් පවතින නීතිමය කාර්යාවලිය

අද වන විට, ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන් පාලනය වන මූලික නීතිය වනුයේ, 1996 අංක 28 දරණ ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත වේ. මෙමඟින් සමාජ සේවා ආමාත්‍යාංශයත් සමඟ එක්ව ආබාධ සහිත පුද්ගලයන් සඳහා ජාතික සභාවක් පිහිටුවන අතර, සභාපතිවරයා විසින් ආබාධ සහිත පුද්ගලයන්ගේ යහපත සහ අයිතිවාසිකම් ප්‍රවර්ධනය කරනු ලබයි. මෙම නීති සම්පාදනය තුළ ආබාධිත තත්ත්වයන්ගේ අයිතිවාසිකම් සඳහා ප්‍රවේශයක් ලබා නොදෙන අතර, ජාතික මට්ටමෙන් ආබාධ සහිත පුද්ගලයන් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති ඇතුළත් වීම අනුමත කරමින් රජයේ භූමිකාව විදහා දැක්වීමට පැහැදිලිවම අපොහොසත් වී ඇත.

ගෝලීය වශයෙන් ආබාධිත තත්ත්වය කෙබදු ආකාරය දැයි පිළිබඳව යම් වෙනස් වීම් සිදු වී ඇති අතර, මෙයින් එකිනෙකට වෙනස් ආකෘතීන් දෙකක් පැන නැගී ඇත: ඒ ආබාධිකත්වයේ වෛද්‍ය ආකෘතිය සහ සමාජ ආකෘතියයි. ආබාධිකත්වයේ වෛද්‍ය ආකෘතිය තුළින් පෙන්වා දෙන්නේ, ආබාධිකත්වය ආබාධිත පුද්ගලයා හැර වෙනත් කිසිවෙකුත් සම්බන්ධ නොවන ප්‍රශ්නයක් වන, ආබාධිත පුද්ගලයා සතු 'ගැටළුවක්' ලෙසටයි. අනෙක් ආකෘතිය වඩාත් ප්‍රගාමී

ආකෘතියකි. සමාජ ආකෘතිය මගින් පෙන්වා දෙනුයේ, සමාජය විසින්ම ආබාධිත නොවන බහුතරයක් පුද්ගලයින්ගේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි සියල්ලක්ම නිමවා දීම තුළින් පුද්ගලයන් ආබාධිත තත්ත්වයට පත් කරන බවයි. සමාජ ආකෘතිය තුළින් ආබාධිත පුද්ගලයෙක් පූර්ණ සහ ඵලදායී ජීවිතයක් ගත කිරීමට ඇති හැකියාවෙන් බැහැර කරනු ලබන, අබලකාරක බාධකයන් අඩු කිරීමට සහ අවසානයේදී ඒවා ඉවත් කිරීමට එහි බර වැඩි වශයෙන් සමාජ වෙත යොමු කර ඇත. සමාජ ආකෘතිය ආබාධ සහිත පුද්ගලයන් අනෙකුත් සිවිල් වැසියන් සමග සමානව සමාජයේ තමන්ගේ අයිතීන් මුහු කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට බල ගන්වනු ලබන සානුකම්පිත-සමාජ සුභ සාධන කේන්ද්‍රීය දෘෂ්ටියෙන් බැහැර වන්නකි.

ආබාධ සහිත පුද්ගලයන් දයාව පෑමේ "වස්තූන්" වශයෙන් දැකීමේ ප්‍රවේශ අත්හැර දැමීම සහ ඒ වෙනුවට ඔවුන් අයිතිවාසිකම් සහිත " පුද්ගලයන්" වශයෙන් සැලකීම සඳහා 2006 ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (Convention on the Rights of Persons with Disabilities (UNCRPD)) මගින් තවදුරටත් සහාය ලබා දෙන ලදී. මෙම සම්මුතියෙන් සහජ ගෞරවය, පුද්ගලයන්ගේ ස්වාධීනත්වය, වෙන් කොට නොසැලකීමේ ප්‍රතිපත්තිය, පූර්ණ හා ඵලදායී සහභාගිත්වය සහ සමාජයේ අන්තර්ගත වීම, අවස්ථාවන් හා ඒවාට ළඟාවීමේදී පවතින සමානාත්මතාව වැනි විශ්ව මානව හිමිකම් ප්‍රතිපත්ති අවධාරණය කරනු ලබයි. ශ්‍රී ලංකාව 2007 දී මෙම ප්‍රඥප්තියට පළමුවෙන්ම අත්සන් තැබූ රටවල් අතරින් එකකි. නමුත් ද්වෛත දේශයක්ව පැවතියත් තවමත් මෙයට ප්‍රඥප්තිය ස්ථිර කිරීමට හැකි වී නොමැත.

සමාජ සේවා අමාත්‍යාංශය විසින් ශ්‍රී ලාංකීය නිති සම්පාදනයන් ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය හා සමග එක් තලයකට ගෙන ඒමට, 2003 ආබාධ සහිත පුද්ගලයන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය මත පදනම්ව නව පනතක් කෙටුම්පත් කිරීමට යෝජනා කරන ලදී. 2006 දී අයිතිවාසිකම් මත පදනම් වූ ප්‍රවේශයක් තුළින් ආබාධිතවූවන් පිළිබඳව කතා කිරීමට උත්සාහ දරණ නව පනත් කෙටුම්පතක් සකසන ලදී. මෙම කෙටුම්පතෙන් ස්වාධීන සංවිධානයක් වශයෙන් කටයුතු කිරීමට නියමිත ආබාධ සහිතවූවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ අධිකාරයක් ස්ථාපිත කරන ලදී. කෙසේනමුත්, සමාජ සේවා අමාත්‍යාංශය එහි අධිකාරිත්වය අඩු කිරීමෙන් කෝපයට පත්වූ අතර, 2006 කෙටුම්පත ප්‍රතික්ෂේප කොට 2010 දී ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සුරැකීමේ පනත් කෙටුම්පත නමින් නව කෙටුම්පතක් ඉදිරිපත් කරන ලදී. මෙම පනත් කෙටුම්පතින් අමාත්‍යවරයා විසින් සභාපතිත්වය දරණ ආබාධ සහිත පුද්ගලයන් සඳහා ජාතික සභාවක් පිහිටුවන ලදී. ආබාධිතවූවන්ගේ අයිතීන් පිළිබඳ පරදුදරන්නන්ගේ කිසිදු උපදේශනයක් නොමැතිව සහ 2006 පනත් කෙටුම්පතේ පවත්නා අයිතිවාසිකම් සැලකිය යුතු අන්දමෙන් අඩු කිරීම නිසාවෙන් 2010 කෙටුම්පතට දැඩි විරෝධතාවයන් පැවතුණි.

තවදුරටත් 2010 පනත් කෙටුම්පත තුළින් ජාතික මට්ටමින් ස්වාධීන අංගයක් බවට පත්වීම මගින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම ඉල්ලුම් කරන පැරිස් ප්‍රතිපත්ති උල්ලංඝනය කරනු ලබයි.

2010 පනත් කෙටුම්පතට පවතින දැඩි විවේචනයන් හේතු කොට ගෙන, සමාජ සේවා අමාත්‍යාංශය සිය තත්ත්වය පිළිබඳව නැවත සලකා බැලීමට උත්සුක විය. 2014 මැයි මාසයේදී 2014 ආබාධ සහිතවූවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත ශ්‍රී ලංකාවේ ආබාධ සහිත වූවන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ව්‍යාපාරය විසින් යෝජනා කරන ලදී. මෙම පනත් කෙටුම්පත 2006 කෙටුම්පතේ යම් ප්‍රගතියක් පෙන්නුම් කරන සංස්කරණයක් වන අතර ගැටළුකාරී ස්ථානය වන 'ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතීන් පිළිබඳ අධිකාරය' වෙනුවට 'ආබාධ සහිත පුද්ගලයන්ගේ කොමිසම' ප්‍රතිස්ථාපනය කරන ලදී. කොමිසමට අත්දැකීම් සහිත, හැකියාවන් ඇති සහ ආබාධිතත්වය හා සම්බන්ධ කරුණු වලදී පිළිගැනීමක් ඇති පුද්ගලයන්ව ඇතුළත් කළ යුතුව ඇති අතරම ආබාධ සහිත පුද්ගලයන්, වෘත්තිකයන්, ආචාර්යවරු සහ සේවා නියුක්තිය, වෘත්තීය පුහුණුව, සෞඛ්‍යය, අධ්‍යාපනය යනාදී අමාත්‍යාංශයන්ට සම්බන්ධ නිළධාරින් තිදෙනෙක්ද ඇතුළත් විය යුතුය.

අවාසනාවකට මෙන්, මෙයද අමාත්‍යවරයා විසින් ප්‍රතික්ෂේප කරන ලද අතර, වර්තමානයේදී ආබාධ සහිත පුද්ගලයන් සඳහා වන නීති සම්පාදන ක්‍රියාවලියේ කිසිදු නිශ්චිත නියමයක් සිදු වී නොමැත.

## නීති සම්පාදනයේ වෙනස්කම්

*දොස්තර අජිත් සී.එස්. පෙරේරාට එ. නීතිපති සහ වෙනත් [S.C. (FR) 221/2009]* යන ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවේදී සඳහන් කරනු ලැබුයේ අලුතෙන් ඉදි වන සෑම පොදු ගොඩනැගිල්ලක්ම ආබාධ සහිත පුද්ගලයන්ට ප්‍රවේශ වීමට හැකිවන පරිදි ඉදිවිය යුතු බවය. ගොඩනැගිලි සම්පූර්ණයෙන් ඉදි කළ පසු ගොඩනැගිල්ලට, සනීපාරක්ෂක ස්ථාන සහ පොදු පහසුකම් වලට ආබාධිත පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි බව සහතික කරවා ගැනීමට උසාවිය නියෝග කරන ලදී. මීට අමතරව, ආබාධ සහිත පුද්ගලයන් සඳහා ප්‍රවේශ පහසුකම් සැපයීම පිළිබඳ නිකුත් කර ඇති අංක 1619/24 (2009.09.18) දින දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව 'දැනට පවතින රජයේ ගොඩනැගිලි, ප්‍රසිද්ධ ස්ථාන සහ සේවා සහිත ස්ථාන, මෙම රෙගුලාසීන් බල පැවැත්වෙන දින පටන් වසර අටක කාලයක් ඇතුළත, මෙම රෙගුලාසීන්ට යටත්ව ආබාධ සහිත පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි ආකාරයට සකස් කරනු ලැබිය යුතුය.' මේ අනුව මෙම නීති සම්පාදනයෙන් සඳහන් කරනු ලබන පරිදි 2017 වන විට සියලුම පොදු ගොඩනැගිලි ආබාධ සහිත පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි අන්දමෙන් ඉදි විය යුතු බවය.



**Photo : Jason Turgeon**

2011 අංක 28 දරණ මැතිවරණ (විශේෂ විධිවිධාන) පනත මගින් ආබාධිත ඡන්දදායකයෙකු මැතිවරණයකදී ඡන්දය ප්‍රකාශ කරන විට වෙනත් පුද්ගලයෙකුගේ සහාය ඇතිව පැමිණීමට ඉඩ ලබා දීම නීතිගත කරන ලදී. ආබාධිත පුද්ගලයාව රැගෙන එන තැනැත්තා ඡන්ද පත්‍රිකාව සලකුණු කළ යුතු වන්නේ මැතිවරණ නිරීක්ෂණ නිළධාරියෙකු සහ ඡන්ද මධ්‍යස්ථානයේ වෙනත් කාර්ය මණ්ඩල සාමාජිකයෙකු ඉදිරිපිටදීය. 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීම පිළිබඳ පනතේ සංශෝධන වලට අනුව, ආබාධයක් සහිත පුද්ගලයෙකු හට

ඔහුගේ/ඇයගේ ඡන්දය ප්‍රකාශ කිරීම සඳහා පනතේ 5 වන උප ලේඛනයට අනුව යෝග්‍යතාව පිළිබඳව සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. මෙයට අයදුම්කරු විසින් ලබා දෙන ප්‍රකාශයක්, ග්‍රාම නිළධාරීවරයාගේ සහතිකයක් සහ රජයේ වෛද්‍ය නිළධාරීවරයාගේ සහතිකය ඇතුළත්ය.

## සමාජීය වෙනස්කම්

පෞද්ගලික අංශය විසින් ආබාධ සහිත පුද්ගලයන් සේවයේ නියුතු කිරීම උදෙසා විවිධ ධනාත්මක පියවර ගෙන ඇත. ප්‍රමුඛ පෙළේ සංවිධාන, බැංකු, ආයතන ආබාධිත පුද්ගලයන්ව සේවයේ නියුක්ත කරලීමේ සහ අනුකලනය කිරීමේ අදහසට වඩා විවෘතව සිටී.

කොළඹ විශ්ව විද්‍යාලය වැනි උසස් අධ්‍යාපන ආයතන විසින් ආබාධිත පුද්ගලයන්ට අධ්‍යාපනය ලැබීමේ හා සේවයේ නියුක්ත වීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීමට මුල් තැන ගෙන ක්‍රියා කරනු ලබයි. කලා පීඨයේ "ආබාධ සහිත සිසුන් සඳහා වන සහාය මධ්‍යස්ථානය" එහි වර්ණ සහයෝගිතා මෘදුකාංගයත් සමඟ දෘශ්‍යාබාධ සහිත සිසුන් සඳහා වර්තමානයේ දකුණු ආසියාවේ පවතින ප්‍රමුඛ මධ්‍යස්ථාන වලින් එකකි.

මෙය ශ්‍රී ලංකාවේ ආබාධිත ක්‍රීඩකයන් සඳහාද බෙහෙවින් උපකාරී වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, දකුණු කොරියාවේ පැවති 2014 ආසියානු පැරා තරඟාවලියේදී  පදක්කම් 14 ක් දිනා ගැනීමට සමත් විය.

## ශ්‍රී ලංකාවේ ආබාධ සහිත පුද්ගලයන්ගේ අනාගතය

ආබාධ සහිත පුද්ගලයන්ගේ තත්ත්වය වෙනස් කිරීමට පොදු මහජනතාව සහ පෞද්ගලික අංශය ප්‍රශංසනීය අන්දමෙන් පියවර ගෙන තිබුණත්, ශ්‍රී ලංකාවේ සමාන පුරවැසියන් වශයෙන් ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් මුළුමනින් ඔවුන්ට භුක්ති විඳීමට තවත් බොහෝ දේ ඉටු කිරීමට පවතී.

තමන්ගේ මූලික අවශ්‍යතාවන් සපුරා ගැනීමට පවා අනෙක් අය මත තවමත් ඔවුන්ට යැපීමට සිදුවීම නිසාවෙන් ආබාධිත පුද්ගලයන්ගේ ස්වාධීනත්වය තවදුරටත් අවතක්සේරුවට පත්වෙමින් පවතී. ඇසුරුම් කළ කිරිපිටි පැකට්, ඖෂධ වර්ග සහ අනෙකුත් මූලික භාණ්ඩ වර්ග මිලදී ගැනීමේ කාර්යය තවමත් දෘශ්‍යාබාධිත පුද්ගලයන් සඳහා අපහසු කර්තව්‍යයක් වී ඇත. ඒ මන්ද, ඇසුරුම් කරන ලද භාණ්ඩ වල අසුරනයේ බ්‍රේල් ආකාරයේ මුද්‍රණයක් නොමැති වීම නිසාවෙනි. සහායක් නොමැතිව දුම්රිය ස්ථානයකට යාමට හෝ බසයක් නවතා ගැනීමට නොහැකි රෝද පුටුව භාවිතා කරන්නෙකුට බසයකට හෝ දුම්රියකට නැඟ ගැනීම කොහෙත්ම කළ නොහැකි කර්තව්‍යයකි.

මෙහිදී සිතට ගත යුතු වැදගත්ම කරුණ වනුයේ, රජය විසින් ආබාධිත පුද්ගලයන් සඳහා උපකාර කිරීම පිණිස විවිධ වෙනස්කම් සිදු කිරිමට සුවිශේෂී භූමිකාවක් රඟ දැක්වූවත්, මෙය රජයටම පැවරුණු විශේෂිත වගකීමක් නොවේ. සානුකම්පිත ප්‍රකාශයන්ගේ සුළු වෙනස්කම් වලින් සහ අප විසින් ආබාධිත පුද්ගලයෙකුගෙන් ඇසිය හැකි ප්‍රශ්න වල සිට ආබාධිත පුද්ගලයෙකු රැකියාවක නියුක්ත වීමේදී හෝ පාසලකට ඇතුළත් වීමේදී, කෙනෙකු තුළ පවතින ආකල්ප ආදී ගැටළු සහ බාධාවන් වලට පුද්ගලයන්, ප්‍රජාවන්, රාජ්‍ය-පෞද්ගලික ආයතන සහ රජය විසින් ගනු ලබන ධනාත්මක පියවරයන් මඟින් එක්ව පිළිතුරු සැපයිය හැකිය. 'ආබාධිකත්වය' යනු විශේෂයෙන්ම ආබාධිත පුද්ගලයා විසින් පමණක් සැලකිලිමත් විය යුතු ගැටළුවක් නොවේ. එහෙත් ඒ වෙනුවට මුළුමහත් සමාජය විසින්ම එක්ව මුහුණ දිය යුතු අභියෝගයකි.

**අනුෂ්කා ගුණවර්ධන** [1]

1 LLB (Hons)

***Published with support from CCFD***
*Send your stories, photos and cartoons to lst.escrprogram@gmail.com*
*Signed articles are the view of the writer.*

*Published in Sinhala, tamil & English and downloadable from*
*http://www.lawandsocietytrust.org/resources.html*